සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** | **නර්තනය - I** | **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. සරඹ අභ්‍යාස කිරීමේ දී සමගුණ වශයෙන් හඳුන්වනුයේ .................................. ලයට නැටීමය.
(1) ප්ලූත (2) ද්‍රෘත (3) මධ්‍ය (4) විලම්භ

02. ''කොකුම් පාට කිතුලින් බත් වළඳා'' මෙම කවි පද කොටස .................................. ගායනයට අයත් වේ.
(1) ටීකා සී පද (2) සිරස පාද (3) ග්‍රහපන්ති කවි (4) මල් යහන්

03. මහනුවර ඇසළ පෙරහැරේ අවසාන දින පහ වීදි සංචාරය කරනු ලබන්නේ .......................................... පෙරහැර නමිනි.
(1) රන්දෝලි (2) වේල් (3) කුඹල් (4) නවම්

04. අංග, ප්‍රත්‍යාංග සහ .................................. තුළින් ආංගික අභිනය නිරූපණය කෙරේ.
(1) වාචික (2) උපාංග (3) පිළිකුල (4) ආදරය

05. කොහොඹා කංකාරියේ නර්තන අංගයක් වන .......................................................................... ගායනය රහිතය.
(1) අස්නේ (2) ගුරුගේ මාලාව (3) ආවැන්දුම (4) මඩුපුරය

06. මාත්‍රා $2+2+4$ තිත් රූපය නම් කරනු ලබන්නේ .......................................... තුන්තිත ලෙස ය.
(1) දෙසුළු මැදුම් (2) දෙසුළු මහ (3) දෙමැදුම් මහ (4) සුළු මැදුම් මහ

07. අනුරාධපුර යුගයේ ආරම්භකයා ලෙස සැලකෙන්නේ .......................................... රජු ය.
(1) දුටුගැමුණු (2) මහා පරාක්‍රමබාහු (3) භාතිකාභය (4) පණ්ඩුකාභය

08. කණ්ඩායමක් වශයෙන් බෙර කරෙහිලාගෙන වාදනය කරනුයේ, මණිපුරි සම්ප්‍රදායේ .................................... නර්තනයේ දී ය.
(1) පුං චොලම්ය (2) මද්දලම් (3) චෙංගිලම් (4) තරිතාල් චොලම්

09. කෝලම් නාට්‍යයේ .................................................... අපර රංගනයට අයත් අංගයකි.
(1) අණබෙර කෝලම (2) ජස කෝලම
(3) ගුරුළු රාක්ෂ කෝලම (4) මුදලි කෝලම

10. විජය හා කුවේණි එක් වූ දින රාත්‍රීයේ .................................. පැවති විවාහ මංගල උත්සවයක නැටුම් තූර්යවාදන හා ගිත ගායනා පැවැත් වි ඇත.
(1) සිරියා පුරයේ (2) සීලවස්තුපුරයේ (3) සිරවක්තුපුරය (4) සිරසවත්ථු පුරයේ

11. ''අඳුන් ගාන්නි නෙත්දෙක ඔමරි කරන්නී......'' මෙය
(1) සොකරි වර්ණනා කරන ලද ගායනාවකි. (2) නොංචි අක්කා වර්ණනා කරන ලද ගායනාවකි.
(3) ලෙංචිනා වර්ණනා කරන ලද ගායනාවකි. (4) පුරන්සිනා වර්ණනා කරන ලද ගායනාවකි.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

12. පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනය සඳහා දායකත්වය සැපයූ ශිල්පියෙකි

(1) රදල්ලේ පොඩි මහත්තයා (2) කේ. එස්. ප්‍රනාන්දු මහතා

(3) චිත්‍රසේන ඩයස් මහතා (4) ජේ. ඊ. සේදරමන් මහතා

13. අප ශාන්තිකර්ම සුරැකිය යුත්තේ

(1) විනෝදයට නැරඹිය හැකි නිසාය. (2) මනහර නර්තන අංග තිබෙන නිසාය.

(3) සාම්ප්‍රදායික හා සංස්කෘතික උරුමයක් නිසාය. (4) විදේශිකයන් අගය කරන නිසාය.

14. වෙස් ඇඳුම් කට්ටලයේ ''පොත්පොට'' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) පබළු වලින් නිමවා කරවට දමන ලද පටියකි.

(2) දෙපසට බඳින රැළි පෙළට සකස් කළ රෙද්දකි.

(3) ජටාව මුදුනේ සිට පිටුපසට එල්ලෙන රෙදි පටියකි.

(4) ඉනට වෙලන කෙළවර නරුවක් සහිත තුනී රතු රෙද්දකි.

15. සරස්වතී මණ්ඩපය කරවන ලද්දේ,

(1) අනුරාධපුර යුගයේ දුටුගැමුණු රජතුමා විසිනි.

(2) පොළොන්නරු යුගයේ නිශ්ශංකමල්ල රජතුමා විසිනි.

(3) පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.

(4) මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා විසිනි.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

| පේළිය | (i) තීරුව | (ii) තීරුව | (iii) තීරුව | (iv) තීරුව |
|---|---|---|---|---|
| A | කථක් | ඔන්චිලිවාරම් | කාවඩි | සොකරි |
| B | ප්‍රශස්ති | කෝලාට්ටම් | නාඩගම් | මනිපුරි |
| C | කෝලම් | භරත | ග්‍රහපංති | දඹදෙණි |
| D | කරගම් | රූකඩ | කථකලි | පන්තේරු |

16. බලි ශාන්තිකර්මයේ දී ගයනු ලබන කවි විශේෂය සඳහන් වන්නේ,

(1) B පේළියේ (i) තීරුවේ ය. (2) C පේළියේ (iii) තීරුවේ ය.

(3) D පේළියේ (iv) තීරුවේ ය. (4) A පේළියේ (ii) තීරුවේ ය.

17. බුදුන්, දෙවියන්, රජුන් වර්ණනා කිරීම සඳහා ගායනා කර ඇති කවි වන්නේ,

(1) B පේළියේ (i) තීරුවේ ය. (2) C පේළියේ (iii) තීරුවේ ය.

(3) D පේළියේ (iv) තීරුවේ ය. (4) A පේළියේ (ii) තීරුවේ ය.

18. මෘදංගය වාදනය කරනු ලබන නර්තන සම්ප්‍රදාය වන්නේ,

(1) B පේළියේ (iii) තීරුවේ ය. (2) A පේළියේ (iii) තීරුවේ ය.

(3) C පේළියේ (ii) තීරුවේ ය. (4) D පේළියේ (ii) තීරුවේ ය.

19. ඝෝරි රංගවස්ත්‍රාභරණය අයත් නර්තන සම්ප්‍රදාය සඳහන් වන්නේ,

(1) B පේළියේ (ii) තීරුවේ ය. (2) D පේළියේ (i) තීරුවේ ය.

(3) D පේළියේ (iii) තීරුවේ ය. (4) A පේළියේ (iii) තීරුවේ ය.

20. මුරුගන් දෙවියන් වෙනුවෙන් ඉදිරිපත් කරන නර්තනයක් සඳහන් වන්නේ,

(1) D පේළියේ (iv) තිරුවේ ය. (2) B පේළියේ (ii) තිරුවේ ය.

(3) D පේළියේ (i) තිරුවේ ය. (4) A පේළියේ (iii) තිරුවේ ය.

21. කේරලයේ පැවති නෘත්‍ය නාටක ඇසුරෙන් විධිමත් සම්ප්‍රදායක් ලෙස කථකලි නර්තනය ගොඩනංවන ලද්දේ

(1) කැලිකට්හි ජැමොරින් රජුය (2) කොට්ඨාරක්කාර තාම්පුරන් රජුය

(3) වල්ලතෝල් නාරායන මෙනන්ය (4) රවීන්ද්‍රනාත් තාගෝර්ය

22. කථක් නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් වනුයේ,

(1) බිර්ජු මහාරාජ්, අච්චන්මහාරාජ්, රවීන්ද්‍රනාත් තාගෝර්ය

(2) නවාබ් වජිද් අලීෂා, රාජා ජැමොරීන්, අච්චන්මහාරාජ්

(3) අච්චන් මහාරාජ්, රවීන්ද්‍රනාත් තාගෝර්, ජිනදාස වික්‍රමසිංහ

(4) නවබ් වාජිද් අලීෂා, අච්චන්මහරාජ්, කල්කාප්‍රසාද්

23. භරත නාට්‍යම් හි උගන්වන ගුරුවරයා හඳුන්වනු ලබන්නේ,

(1) ආසන් නමිනි (2) නට්ටුවාංගම් නමිනි (3) නටුවනාර් නමිනි (4) මහාරාජ් නමිනි

24. මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍යයක් ලෙස පිළිගැනෙන්නේ,

(1) ශ්‍රී නාමය (2) පවන (3) ශෘංගාලංකාරය (4) පැරකුම්බා සිරිත

25. ''දොංත ගතම් දොංත ගතිගතම් - තත් රෙගතම් රෙගිති ගති ගතම්'' මෙම බෙර පදයට අනුව සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,

(1) අණබෙරකරුය (2) ලෙංචිනාය (3) මුදලිය (4) නොංචිය

26. ලී මල්ලිය නොහොත් ලණු දඟර දමමින් කණුවක් වටා නර්තනය කිරීමට සමාන වන ද්‍රවිඩ ගැමි නැටුම ලෙස ...................................... හැඳින්වේ.

(1) කෝලාට්ටම් (2) පින්නල් කෝලාට්ටම් (3) සුලකු (4) සෙම්බු

27. අඬ ඉර, බොකු හම් සහ ගැටිය යොදාගනු ලබන්නේ පිළිවෙලින්

(1) ගැටබෙරය, පහතරට බෙරය, බුම්මැඩිය සඳහා ය.

(2) ගැටබෙරය, පහතරට බෙරය හා දවුල සඳහා ය.

(3) ගැටබෙරය, රබාන හා දවුල සඳහා ය.

(4) උඩැක්කිය, රබාන හා දවුල සඳහා ය.

28. වාහල නර්තනය හා පත්තිනි නර්තනය දැකිය හැකි වන්නේ,

(1) පහතරට දෙවොල් මඩුවේදී ය. (2) සබරගමු පහන් මඩුවේදී ය.

(3) සබරගමු දෙවොල් මඩුවේදී ය. (4) උඩරට ගම් මඩුවේදී ය.

29. නර්තන ශෛලීන් දෙකක අනන්‍යතාවය හඳුනාගැනීමට ඉවහල්වන සාධක වන්නේ,

(1) රංග වින්‍යාසය, රංග වස්ත්‍ර හා අභිනයය (2) රංග වස්ත්‍ර, වාද්‍ය භාණ්ඩ හා රිද්ම රටාය

(3) රංග වස්ත්‍ර, වාද්‍ය භාණ්ඩ හා අංගහාරය (4) වාද්‍ය භාණ්ඩ, අංගහාර හා අභිනයය

30. නර්තනයේ ප්‍රායෝගික කොටස් භාවිත කරන ආකාරය ලියාදැක්වීම

(1) අංගරචනයයි. (2) ප්‍රස්තාරකරණයයි. (3) අනුකරණයයි. (4) සංස්කරණයයි.

31. උඩරට නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික සරඹ පද්ධතිය වන්නේ

(1) පා සරඹ හා ඉලංගම් සරඹ (2) දණ්ඩියමේ සරඹ හා දොඹින පද

(3) පා සරඹ හා මණ්ඩි පද (4) පා සරඹ හා ගොඩ සරඹ

32. කොහොඹායක් කංකාරි ශාන්ති කර්මයට පමණක් ආවේණික වාදන අවස්ථාවකි

(1) මඟුල් බෙර වාදනය (2) පිං බෙර වාදනය (3) දැකුම් අත් වාදනය (4) අත්‍යා බෙර වාදනය

33. උඩරට වෙස් ඇඳුම් කට්ටලය නිර්මාණය කර ඇත්තේ

(1) කොහොඹ දෙවියන්ගේ ඇඳුමේ හැඩයට අනුවය

(2) විජය රජුගේ ඇඳුමේ හැඩයට අනුවය

(3) මලය රජුගේ ඇඳුමේ හැඩයට අනුවය

(4) පඬුවස් දෙව් රජුගේ ඇඳුමේ හැඩයට අනුවය

34. කුදංත ගත දොං වට්ටමට අදාළ තාල රූපය සහ තිත වන්නේ

(1) මාත්‍රා 3 + 4 තාල රූපය හා මැදුම් මහ දෙතිතයි.

(2) මාත්‍රා 4 + 4 තාල රූපය හා මහ තනි තිතයි.

(3) මාත්‍රා 2 + 2 + 4 තාල රූපය හා දෙසුලු මහ තුන් තිතයි.

(4) මාත්‍රා 2 + 2 + 3 තාල රූපය හා දෙසුලු මැදුම් තුන් තිතයි.

35. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් 18 ට අයත් වේ.

(1) මුසලඩි හා අනිලා (2) සිංහරාජ හා විරාඩි (3) මුසලඩි හා කොවුලා (4) සිංහරාජ හා තුරඟා

36. ජෙං තත් තත් /// ජේං තා, ජෙනු තත් තත් /// ජෙනු තා මෙම පද කොටස

(1) මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් අඩව්වකි.

(2) මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් කස්තිරමකි.

(3) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් අඩව්වකි.

(4) මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් සීරු මාරුවකි.

37. ගැට බෙරයෙන් වාදනය කරනු ලබන සතර බීජාක්ෂර වේ

(1) තත්, ජිත්, තොන්, නං (2) තත්. දිත්, තොන්, නං

(3) තකට, ජිකට, තොගට, නගට (4) තකරෙං, ජිකරොං

38. රම්මොලවක අධිකාරම් විසින් උඩරට වන්නම් ප්‍රබන්ධ කළ බව සඳහන් වන්නේ

(1) ගණිතාලංකාර බමුණු පඬිවරයා රචනා කළ නෙර්තමාලය කෘතියේ ය.

(2) ජේ. ඒ. සේදරම් මහතාගේ උඩරට නැටුම් කලාව කෘතියේ ය.

(3) සී. ද එස්. කුලතිලක මහතාගේ දහඅට වන්නම් කෘතියේ ය.

(4) ජේ. ඒ. සේදරමන් මහතාගේ නෘත්‍ය රත්නාකරය කෘතියේ ය.

39. කොහොඹයක්කංකාරි ශාන්තිකර්මයට පමණක් ආවේණික සැරසිලි වේ.

(1) අයිලය හා යක් ගෙය (2) තොරණ සහ යහන

(3) තොරණ සහ යක් ගෙය (4) අයිලය සහ කාලපන්දම් ගස

40. උඩරට නර්තන කලාව පිළිබඳ පර්යේෂණ කෘති බොහෝමයක් රචනා කළ ග්‍රන්ථ කතුවරයෙකි

(1) මහාචාර්ය මුදියන්සේ දිසානායක (2) මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ

(3) මහාචාර්ය ලයනල් බෙන්තරගේ (4) මහාචාර්ය තිස්ස කාරියවසම්

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** **නර්තනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

(i) 1952 රජයේ ලලිත කලායතනය සහ .......................................... වර්ෂයේ දී සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භවීමෙන් පසු කලායතන බිහිවිය.

(ii) ''භාරතීය සම්භාව්‍ය නර්තන කලා කෘතිය'' නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ ................................. විසිනි.

(iii) කෝළම් නාටකයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ එක් එක් චරිත සඳහා ........................................... පැළඳීමයි.

(iv) කථකලි නර්තනයේ වාද්‍ය භාණ්ඩයක් වන ................................................ ශුෂිර වාද්‍ය භාණ්ඩයකි.

(v) කොලොන්න පද සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ............................................ ශාන්තිකර්මයේ ගායනය රහිත නර්තන අංගයකි.

(vi) තිත වාදනය කිරීමෙන් පසු ගායනයක් ආරම්භ කිරීම .................................................... නම් වේ.

(vii) රවීන්ද්‍රනාත් තාගෝර් තුමා 1934 දී ................................................. ආයතනයට මුල්ගල තැබීම සඳහා මෙරටට පැමිණියේ ය.

(viii) විශ්මය නම් වූ ස්ථායි භාවය මුල්කොට ගනිමින් ..................................................... රසය උපදී.

(ix) ''හනික වරෙව් කොල්ලනේ .......'' මෙම ගීතය ඇතුළත් නාට්‍ය හා එහි නිර්මාණ ශිල්පියා වන්නේ

1. නාට්‍යය ඃ- 2. නිර්මාණ ශිල්පියා ඃ-

(x) සුරත්තට්ටුව දැකිය හැකි වාද්‍ය භාණ්ඩය හා එම වාද්‍ය භාණ්ඩය අයත් නර්තන සම්ප්‍රදාය නම්

1. වාද්‍ය භාණ්ඩය ඃ- 2. නර්තන සම්ප්‍රදාය ඃ-



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(02) (i) සැවුලා වන්නමේ බෙර පදය ප්‍රස්ථාර කරන්න.

(ii) ''යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැගිලා පරංගි'' මෙම කවි පදය මාත්‍රා 3 තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

(iii) කුදංත ගත දොම් වට්ටමේ පළමු අඩව්ව ප්‍රස්ථාර කරන්න.

(03) පහත සඳහන් මාතෘකා අතරින් තුනක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) නර්තන කලාව හා බැඳි පර්යේෂණ කෘති

(ii) ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය

(iii) පන්තේරු කවි

(iv) චිත්‍ර කලාවෙන් නර්තනයට ඇති ප්‍රතිලාභ

(v) ද්‍රවිඩ ජන නැටුම්

(04) ''උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්ම ත්‍රිත්වය අතර සමානතා මෙන්ම අසමානතා ද දැකිය හැකිය.''

(i) සම්ප්‍රදායන් දෙකක් උදාහරණයට ගනිමින් පුද ලබන දෙවිවරු ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.

(ii) මඩු ශාන්තිකර්මවල චාරිත්‍ර විධි ඇසුරින් සමානතා හා අසමානතා පිළිබඳ විග්‍රහ කරන්න.

(iii) කොහොඹාකංකාරියේ, දෙවොල්මඩුවේ, පහන්මඩුවේ එන නර්තනාංගවල දැකිය හැකි සමානතා හා අසමානතා පරීක්ෂා කරන්න.

(05) ''ලොව සෑම ජන කොට්ඨාසයකටම ආවේණික වූ ජන කලාවක් පවතී.''

(i) කෝලම් හෝ සොකරි නාටකයේ එක් චරිතයක් විස්තර කරන්න.

(ii) ''ගැමි ජනතාවගේ සරල දිවිපැවැත්ම ගැමි නැටුම් හා එම ගායනා මගින් පිළිබිඹු කරයි.'' ගැමි නැටුම් දෙකක් නිදසුන් ගෙන සනාථ කරන්න.

(iii) සොකරි හා කෝලම්වල දී දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.

(06)



A B C

(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම්කර එහි සංගීත සම්ප්‍රදාය පිළිබඳ හඳුන්වන්න.

(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායට අදාළ වේශ නිරූපණ ක්‍රමවේද පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

(iii) C රූපයේ දැක්වෙන රංග කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න.

(07) නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථතාවය පිළිබඳ අගයමු.

(i) මානසික ස්වස්ථතාවය කෙරෙහි බලපාන සාධක 2 නම් කර ඒ පිළිබඳ විස්තර කරන්න.

(ii) ළමයාගේ මානසික ස්වස්ථතාවය ප්‍රදර්ශනය වන්නේ කෙසේද? එම අවස්ථා නම් කරන්න.

(iii) මානසික ස්වස්ථතාවය හා නර්තන ක්‍රියාවලිය පිළිබඳව විස්තර කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

## 11 ශ්‍රේණිය නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

| ප්‍රශ්න අංකය | ක්‍රියාකාරකම | |
|---|---|---|
| (01) | ක්‍රියාකාරකම - ගායනය හා වාදනය | |
| | (i) කැමති ගායනය | 05 |
| | (ii) නම්කරන ලද ගායනය (විෂය නිර්දේශයට අදාළව ගුරුවරයා නම් කළ) | 05 |
| | (iii) කැමති බෙර සරඹයක් (ලය තුනට) | 05 |
| | (iv) දෙතිතේ තාල රූපයට අයත් බෙර පදයක් වාදනය කිරීම | 05 |
| | මුළු ලකුණු | 20 |
| (02) | ක්‍රියාකාරකම - සරඹ හා වට්ටම් නැටීම | |
| | (i) 8 සිට 12 ගොඩ සරඹ වලින් එකක් නර්තනය කරන්න | 10 |
| | (ii) සරඹයට අදාළ කස්තිරම නර්තනය කරන්න | 10 |
| | මුළු ලකුණු | 20 |
| (03) | ක්‍රියාකාරකම - වන්නම් නැටීම | |
| | (i) 6 - 11 ශ්‍රේණිවලට අදාල වන්නම්වලින් එකක් | 10 |
| | (ii) කස්තිරම/ සීරුමාරුව/ අඩව්ව නර්තනය | 10 |
| | මුළු ලකුණු | 20 |
| (04) | ක්‍රියාකාරකම - ගැමි හා ජීවන වෘත්තීන් හා බැඳි නර්තන | |
| | (i) කඩු/ රබන්/ චාමර/ මෝල්ගස් නර්තනය | 20 |
| | මුළු ලකුණු | 20 |
| (05) | ක්‍රියාකාරකම - නාට්‍ය ගී | |
| | (i) චරිත/ සිද්ධි ඇසුරින් නර්තන නිර්මාණ | 20 |
| | 1. කුඹුරු කොටමින් සිටින ගොවියෙකුට කුඹුරේ තිබී පෙට්ටියක් හමුවේ. එය විවෘත කර බැලූවිට එයින් භූතයෙක් මතුවේ. බියට පත් වුවත් භූතයා සමග මිත්‍රවන ගොවියා තම කුඹුර අස්වද්දයි. | 20 |
| | 2. මැණිකක් රකිනා නාග රාජයකු එය සොරාගැනීමට පැමිණෙන සොරකුට පහරදෙයි. පසුව නැවත මැණික ආරක්ෂා කරයි. | |
| | 3. මුවකු පසුපස លුහුබඳින දඩයක්කරු බොරුවලකට වැටේ. මහත් වෙහෙසක් දරා ඉන් ගොඩට විත් වේදනාවෙන් ආපසු යයි. | |
| | මුළු ලකුණු | 100 |

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 4 ) | 02. ( 3 ) | 03. ( 1 ) | 04. ( 2 ) | 05. ( 3 ) | 06. ( 2 ) | 07. ( 4 ) | 08. ( 1 ) | 09. ( 3 ) | 10. ( 4 ) |
| 11. ( 1 ) | 12. ( 2 ) | 13. ( 3 ) | 14. ( 4 ) | 15. ( 2 ) | 16. ( 2 ) | 17. ( 1 ) | 18. ( 3 ) | 19. ( 3 ) | 20. ( 4 ) |
| 21. ( 3 ) | 22. ( 4 ) | 23. ( 3 ) | 24. ( 4 ) | 25. ( 4 ) | 26. ( 2 ) | 27. ( 2 ) | 28. ( 1 ) | 29. ( 3 ) | 30. ( 2 ) |
| 31. ( 4 ) | 32. ( 4 ) | 33. ( 3 ) | 34. ( 3 ) | 35. ( 4 ) | 36. ( 1 ) | 37. ( 1 ) | 38. ( 4 ) | 39. ( 1 ) | 40. ( 1 ) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)

## II කොටස

(01) (i) 1956 (ii) ජයසේන කෝට්ටේගොඩ මහතා (iii) වෙස් මුහුණු

(iv) කුම්භ (v) පහන්මඩු (vi) අවග්‍රහ

(vii) හොරණ ශ්‍රීපාලී (viii) අත්භූත

(ix) 1. නාට්‍ය - බෙරහඬ 2. නිර්මාණ ශිල්පියා - බන්දුල ජයවර්ධන

(x) 1. ගැටබෙරය 2. උඩරට

(02) (i)

| ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |

(ii)

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| යුද් | - | දෙ | ටත් | - | ඇ | විත් | - | සි | දු | පි | ට |
| නැවි | - | - | නැ | ගී | - | ලා | - | ප | රං | - | ගි |

(iii)

| ^ | | ^ | | / | | | | ^ | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| + | + | + | + | තාම් | - | - | දො | මි | ති | ග | ත | දො | මි | කි | ට |
| කඩ | තක | තරි | කිට | ති | ත | ක | දො | මි | ති | ග | ත | කීත් | - | තත් | - |
| කු | ද | කු | ද | තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ට |
| තරි | කිට | කුං | දත් | තා | | | | | | | | | | | |

(i), (ii), (iii) කොටස් තුනේම 4 x 3 = ලකුණු 12

නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතය - ලකුණු 02

බෙරපද නිවැරදිව ප්‍රස්ථාර කිරීමට - ලකුණු 02 මුළු ලකුණු 04 යි.

(03) (i) නර්තන කාලාව හා බැඳි පර්යේෂණ කෘති

- * ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය පත්වීමෙන් පසු බොහෝ පර්යේෂණ කෘති විශ්ව විද්‍යාල මට්ටමින් සම්පාදනය වී ඇති බව.
- * එයින් නර්තන කලාවේ පෝෂණය මෙන්ම අනාගතයට ද වැදගත් වන බව.
- * පර්යේෂණ ග්‍රන්ථ ලියූ විද්වතුන් අතර මුදියන්සේ දිසානායක, ජයසේන කෝට්ටෙගොඩ, ශ්‍රියානි රාජපක්ෂ, තිස්ස කාරියවසම් නම් කළ හැකි බව.
- * ඔවුන්ගේ පර්යේෂණ කෘති නම් කිරීම හා එහි අන්තර්ගතය දැක්වීම

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(ii) ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය
- * චිත්‍රසේන මහතාගේ බිරිඳ වූ ඇය එතුමා යටතේ නර්තනය හැදෑරූ දක්ෂ ශිල්පිණියක් බව.
- * කුමුදුනී, රන්කිකිලී, ගිනිහොරා, හපනා ආදී වශයෙන් ළමා මුද්‍රා නාට්‍ය රාශියක් නිර්මාණය කිරීම.
- * කාන්තාවට සුදුසු නර්තන ඇඳුම් කට්ටලයක් නිර්මාණය කළ බව.
- * නර්තන ක්ෂේත්‍රයේ විවිධ දස්කම් පෑ ශිෂ්‍ය ප්‍රජාවකට ගුරුවරියක් වූ බව.
- * කරදිය මුද්‍රා නාට්‍යයේ සිසීගේ චරිතය තුළින් ඇගේ දක්ෂතා පෙන්වූ බව.

(iii) පන්තේරු කවි
- * උඩරට නර්තන සම්ප්‍රදායට අයත් සබ නැටුමක් වන පන්තේරු නැටුමට මෙම කවි ගායනා කරන බව.
- * විහාර, පන්සල්වල පවත්වන සූවිසි විවරණ, සංස්කෘති වැනි ආගමික උත්සවවලදී කවි ගායනා කරන බව.
- * මෙම කවිවලට අනුව පන්තේරුව අතට ගන්නේ පත්තිනි දේවියගේ අවසරය මත බව.
- * උදාහරණ ලෙස කවි පද ලියා තැබිය හැකි බව.

(iv) ද්‍රවිඩ ජන නැටුම්
- * දමිල ජනතාවගේ මෙම නැටුම් දකුණු ඉන්දියානු සංස්කෘත ලක්ෂණයන්ට සමීප බවක් පෙන්නුම් කරන බව.
- * උදාහරණ ලෙස සෙම්බු, කෝලාට්ටම්, පින්නල්කෝලාට්ටම්, සුලකු, කාවඩි ජන නැටුම් ලෙස නම් කළ හැකි බව.
- * ඇඳුම් පැළඳුම් වලදී කාන්තාවන් සාරියෙන් හෝ වළලුකර දක්වා දිග සායකින් සැරසෙන බව.
- * සතුට, විනෝදය, ආගමික අවශ්‍යතා මුල්කොටගෙන සාමූහිකව හා සරලව මෙම නැටුම් නිර්මාණය වී ඇති බව.
- * නර්තනයට අදාළ රංග උපකරණ සහිතව නර්තනයේ යෙදෙන බව.

(v) චිත්‍ර කලාවෙන් නර්තනයට ඇති ප්‍රතිලාභ
- * නර්තන නිර්මාණයේ දී වර්ණ, හැඩතල, රටා, මෝස්තර යොදාගන්නා බව.
- * අංගරචනය හා ඇඳුම් පැළඳුම් නිර්මාණයේ දී චිත්‍ර කලාව යොදාගන්නා බව.
- * වේදිකා පසුතල, රංග භාණ්ඩ, රංගාලෝකය සඳහා පිටිවහලක් වන බව.
- * ඇඹීම්, නෙලීම්, පිංතාරු කිරීම් සඳහා චිත්‍ර කලාවේ දායකත්වය.

(මාතෘකා 3 ක් විස්තර කිරීමට ලකුණු 4 බැගින් ලකුණු 12 යි.)

(04) (i)
- * කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දී කොහොඹා දෙවිවරු, බණ්ඩාර දෙවිවරු, අමරාපතී, වීරමුණ්ඩ ආදී දෙවිවරු ප්‍රධාන වශයෙන් පුද ලබයි. මෙම දෙවියන් පහතරට හා සබරගමු ශාන්තිකර්මවල දී පුදනොලබයි.
- * පහතරට දෙවොල්මඩුවේ දී පත්තිනි, දෙවොල්, විෂ්ණු, සමන්, නාථ, වාහල, මංගර හා දොළහ දෙවිවරු පුද ලබන බව.
- * වෙන් වෙන් වශයෙන් වූ දෙවියන් පුද ලබන මෙම ශාන්තිකර්ම තුළදී අසමානතා දැකිය හැකි බව.
- * දෙවොල්මඩුවේ හා පහන්මඩුවේ දී එකම දේව සංකල්ප පුද ලබන අතර පහන්මඩුවේ දී සමන් දෙවියන් විශේෂ වීම අසමානතා වන බව. (ලකුණු 2 ක් විස්තර කර ඇත්නම් ලකුණු 04)

(ii)
- * කප් සිටුවීම, මඩුපේ කිරීම, තොටපේ කිරීම, ගස් වෙන්කිරීම, ඇඳුරන් පේ වීම ආදී චාරිත්‍ර සම්ප්‍රදායන් තුනෙහිම සමානතාවයන් දක්වන බව.
- * කොහොඹා කංකාරියට පමණක් ආවේණික වූ බතබුලතේ යාම එක් චාරිත්‍රයක් බව.
- * ඔරුමාල පිදෙන්න ඔප්පු කිරීම, මිල්ල කැපීම, පහතරට හා සබරගමුවට ආවේණික බව.
- * කාලපන්දම් ගස සිටුවීම, බිසෝකප සිටුවීම, දොවොල්මඩුවට ආවේණික බව.
- * ආභරණ වැඩමවීම, පොදු චාරිත්‍රයක් බව (කරුණු 2 ක් විස්තර කර ඇත්නම් ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(iii) * යක්ඇනුම, අස්නෙ, ආවැන්දුම, යක්තුන්පද, දුනුමාලප්පුව, කොහොඹාකංකාරියට ආවේණික නර්තනාංග බව.

* හත්පදය නර්තනය ශාන්තිකර්ම තුනෙහිම දක්නට ඇතත් පහතරට හා සබරගමුවේදී එය ගායනා සහිත වීම.

* දෙවොල්මඩුවේ හා පහන්මඩුවේ දොවොල් නැටීම හා තෙල්මෙ නැටීම නාමිකව යම් සමානතා දක්වුවද සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ ඇති බව.

* කොහොඹා කංකාරියේ හා පහන්මඩුවේ ගායනා සහිත හා රහිත යනුවෙන් නර්තනාංග වෙන්කර දක්විය හැකි වුවද දෙවොල්මඩුවේ දී එසේ වෙන් කළ නොහැකි වන්නේ සෑම නර්තන අංගයකටම සුළු වශයෙන් හෝ ගායනය ඇතුළත්ව ඇති බව.

(කරුණු 2 ක් විස්තර කර ඇත්නම් ලකුණු 04)

(05) (i) චරිත නම් කිරීමට - ලකුණු 01)

චරිතය හැඳින්වීම, කවි යොදාගැනීම, ඇඳුම් පැළඳුම් ගැන විස්තර කිරීම ආදී කරුණු ඇත්නම් (ල. 03)

(ii) * ගැමි නැටුම් දෙකක ගායනා මගින් ගැමියාගේ ජීවන රටාව දක්වා ඇති බව

* ගැමි නැටුම් හා ගැමි ගායනාවලින් හෙළිවන ආගමික සබඳතා, හිරු සඳු වැනි ස්වභාවික වස්තූන් දේවත්වයෙන් පිදීම, සාමූහිකත්වය ආදී කරුණු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම. (ලකුණු 04)

(iii) * සම්ප්‍රදාය හා ප්‍රචලිත ප්‍රදේශ * වාද්‍ය භාණ්ඩ

* රංග වස්ත්‍රාභරණ * චරිත නිරූපණ

* රංගභූමිය හා රංගභාණ්ඩ

ආදී කරුණු ඇසුරෙන් වෙනස්කම් පිළිබඳ කරුණු සනාථ කිරීම (ලකුණු 04)

(06) (i) * මනිපුරි නර්තනය බව හඳුනාගෙන නම් කිරීම

* උත්තරභාරතීය රාගධාරී සංගීතය (හින්දුස්ථානි) භාවිතා කරන බව

* සංගීතය සැපයීමට යොදාගන්නා වාද්‍ය භාණ්ඩ පිළිබඳව හැඳින්විය යුතු බව.

* පූං වාද්‍ය භාණ්ඩ භාවිත කරන බව.

* වාදනය කරන ආකාරය පැහැදිලි කළ යුතු බව.

(නම් කිරීමට ලකුණු 01 යි. විස්තර කිරීමට ලකුණු 03 යි. මුළු ලකුණු 04 යි.)

(ii) * නර්තන සම්ප්‍රදාය හඳුනාගෙන නම්කළ යුතු බව.

* සංකීර්ණ වේෂ නිරූපණ ක්‍රමයක් භාවිත වන බව.

* වේෂ නිරූපණ ක්‍රම නම් කර තිබේ නම්

* වේෂ නිරූපණ ක්‍රම අනුව චරිත නම්කර තිබේනම්

(හඳුනාගැනීමට ලකුණු 01 යි. විස්තර කිරීමට ලකුණු 03 යි. මුළු ලකුණු 04 යි.)

(iii) * දේශීය මුද්‍රා නාට්‍ය හඳුනාගෙන ඇති බව.

* රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ පැමිණීමෙන් පසුව ආරම්භ වූ බව.

* මුද්‍රා නාට්‍ය ඉගිනළු නමින් හඳුන්වා ඇති බව.

* භාරතීය නෘත්‍ය නාටක හා බටහිර බැලේ ආභාෂය ලබා ඇති බව.

* මුද්‍රා නාටක ශිල්පීන් හා ඔවුන්ගේ නිර්මාණ සඳහන් කිරීම. (ලකුණු 04)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(07) (i) කායික සාධක / මානසික සාධක

කායික සාධක

මානසික ස්වස්ථතාව සඳහා කායික නිරෝගීකම ප්‍රබල සාධකයකි. මේ මගින් මාංශ පේශිවල ක්‍රියාකාරීත්වය, ලේ ගමනාගමනය, අස්ථි මනා ලෙස ක්‍රියාකිරීම, සමබරතාවය, ඇගේ හැඩය යන කරුණු

මානසික සාධක

මානසික නිරෝගී බව, පුද්ගල සමබරතාවය, ආහාරපාන, අධික පීඩන, දෛනික ක්‍රියාවලීන් බලපායි. (ලකුණු 04)

(ii)
* ළමයා හැසිරෙන ආකාරය
* සමාජයට අනුගත වීම
* එම වයස් කණ්ඩායම් හා ගැළපෙන ආකාරය ප්‍රදර්ශනය
* වයසට ගැළපෙන පෞරුෂ වර්ධනය
* තමන් පිළිබඳව ධනාත්මකව අභිමානයක් තිබීම
* සෑමවිටම අලුත් දේ සෙවීම
* කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම
* අන් අදහස්වලට ගරු කිරීම

යන කරුණු පහක් තිබේනම් (ලකුණු 04)

(iii)
* නර්තනය ඉගැන්වීම් ඉගෙන ගැනීම
* පුහුණු වීම, රසවිඳීම යන කරුණු
* ආගමික පරිසරයක් තුළින් කායික, මානසික, හික්මීම ඇතිවේ.
* ගුරුවරයාට ආචාර, සමාචාර කිරීම
* වැඩිහිටි ශිල්පීන් අන්‍යෝන්‍ය ආචාර සමාචාර කිරීම
* සාරධර්ම පද්ධතියක් උරුම කර දිය හැකිය
* අංග, ප්‍රත්‍යාංග, උපාංග හසුරුවන්නේ කෙසේද යන්න මනා ලෙස ඉගෙන ගැනීම යනාදී කරුණු (ලකුණු 04)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍ර සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


LOL.lk


අමතන්න - 071 777 4440/0756999990/071 8540371







































# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්
# ගෙදරටම ගෙන්ව ගන්න
# ඔන්ලයින් ඔඩර් කරන්න
# WWW.LOL.LK
# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers